# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2416/38 - 2024** දෙසැම්බර් මස **27** වැනි සිකුරාදා **- 2024.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

පී. ඩී. පී. පුස්සැල්ල මයා, අංක 105, රාමසිංහ පාර, දළුගම, කැළණිය.

සහ

ලංකා ධීවර සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/එෆ්, කුමාරි ජයරත්න මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය .

2024 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A - G 043365 - 14 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: මගේ අංකය: IR/COM/04/2023/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ඩී. පී. පුස්සැල්ල මයා, අංක 105, රාමසිංහ පාර, දළුගම, කැළණිය.

සහ

ලංකා ධීවර සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ලංකා ධීවර සංස්ථාවේ සේවය කරනු ලබන පී. ඩී. පී. පුස්සැල්ල මහතාට සාමාන්‍යාධිකාරි තනතුරේ රාජකාරී ආවරණය කරන ලද 2017.12.07 සිට 2019.05.01 දක්වා කාලය සඳහා වැඩ බැලීමේ දීමනාවක් හිමි ද, හිමිනම් එය ලබා නොදීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0266

---

මගේ අංකය : IR/COM/04/2022/52.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

එස්. ජී. ඒ. ප්‍රනාන්දු මහතා, අංක 15, මෝල පාර, නාගොඩ. කඳාන

සහ

සොල්ස්පෙක්ට්‍රම් (ප්‍රයිවට්) ලිමිටඩ්, 5 වන මහල, අංක 128/ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන

වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, ආචාර්ය කේ. ඒ. තිලකරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මහාචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. ජී. ඒ. ප්‍රනාන්දු මහතා, අංක 15, මෝල පාර, නාගොඩ. කඳාන

සහ

සොල්ස්පෙක්ට්‍රම් (ප්‍රයිවට්) ලිමිටඩ්, 5 වන මහල, අංක 128/ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"සොල්ස්පෙක්ට්‍රම් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) ලෙස සේවය කළ එස්. ජී. ඒ. ප්‍රනාන්දු මහතාට 2018 ජුනි මස සිට 2018 නොවැම්බර් මස දක්වා කාල සීමාව සඳහා පත්වීම් ලිපියේ සඳහන් දීමනා සඳහා හිමිකමක් තිබේද හිමිකමක් තිබේ නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.